# NATIONAL ACCOUNTING (Part-VI)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

## වියදම් ප්‍රවේශය ඔස්සේ දළ දේශීය නිෂ්පාදිතය

වියදම් ප්‍රවේශය ඔස්සේ දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරනුයේ ආර්ථිකයේ යම් කාලපරිච්ඡේදයක දී නිෂ්පාදිතය මිල දී ගැනීම සඳහා කරන මුළු වියදම ගණනය කිරීමෙනි.

## දළ දේශීය වියදමේ පවතින ස්වරූප

- කුටුම්බ පරිභෝජන වියදම
- රාජ්‍ය පරිභෝජන වියදම
- දළ ආයෝජන වියදම

ClassWork.LK

# පරිභෝජන වියදම් වර්ගීකරණය

- අවසාන පරිභෝජන වියදම
  Final consumption expenditure

- සත්‍ය සුනිශ්චිත පරිභෝජන වියදම
  Actual Final consumption expenditure

# අවසාන පරිභෝජන වියදම

අවසාන පරිභෝජන වියදම යනු භාණ්ඩ හා සේවා අත්පත් කර ගැනීමට කරනු ලබන වියදම් වේ.

සත්‍ය සුනිශ්චිත පරිභෝජන වියදම සැබැවින් ම භාණ්ඩ හා සේවා අත්පත් කර ගැනිම සඳහා වියදම් කරන්නේ කවරෙක් ද යන්න නොසලකා ගණනය කරන වියදම යි.

එසේ වන්නේ සැම විට ම වියදම් දරන්නා හා පරිභෝජනය කරන්නා එකම පුද්ගලයකු නොවන නිසා ය. (නිදසුන් - රජයේ සෞඛ්‍ය සේවය මගින් පාරිභෝගිකයා ලබන වාසිය)

ClassWork.LK

# අවසාන පරිභෝජන වියදම වර්ගීකරණය

- පෞද්ගලික පරිභෝජන වියදම් (Private Consumption)
- පොදු පරිභෝජන (රාජ්‍ය) වියදම (Government Consumption)

# පෞද්ගලික පරිභෝජන වියදම

පෞද්ගලික පරිභෝජන වියදම යනු කුටුම්බ පරිභෝජන වියදම් හා ලාභ නොලබා ගෘහ ඒකකවලට සේවා සපයන ආයතන ලබා දෙන සේවාවල (NPISH) එකතුව යි.

විදේශ රටවලින් කුටුම්බ වෙත ලැබෙන ත්‍යාග ආදිය ද පෞද්ගලික පරිභෝජනයට ඇතුළත් වේ.

ClassWork.LK

## පොදු පරිභෝජන වියදම්

පොදු පරිභෝජන වියදම් (රාජ්‍ය මිල දී ගැනීම්) යනු මධ්‍යම රජය හා එහි උප ආයතන භාණ්ඩ හා සේවා මිල දී ගැනීම් සඳහා දරන වියදම යි.

## පොදු (රාජ්‍ය) පරිභෝජන වියදම වර්ගීකරණය

- පුද්ගල පරිභෝජන වියදම (Individual Consumption Expenditure)
- සමූහ පරිභෝජන වියදම (Collective Consumption Expenditure)

Class Work.LK

## පුද්ගල පරිභෝජන වියදම
## (Individual Consumption Expenditure)

රජය විසින් කරනු ලබන පුද්ගල පරිභෝජන වියදම් ලෙස අධ්‍යාපන, සෞඛ්‍ය, සමාජ ආරක්ෂණ වියදම්, සුභසාධන, ක්‍රීඩා හා විනෝදය සඳහා කරන වියදම් ඇතුළත් වේ.

## සමූහ පරිභෝජන වියදම
## (Collective Consumption Expenditure)

රජය විසින් කරනු ලබන සමූහ පරිභෝජන වියදම් සඳහා ආරක්ෂණ වියදම් රාජ්‍ය පරිපාලන වියදම්, දුම්රිය හා මහාමාර්ග සඳහා කරන වියදම් ඇතුළත් වේ.

ClassWork.LK

## ප්‍රාග්ධන සම්පාදනය

නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා භාවිත වන යන්ත්‍ර සූත්‍ර, මෙවලම්, ගොඩනැගිලි, කර්මාන්ත ශාලා හා පවත්නා තොග ප්‍රාග්ධන සම්පාදනය ලෙස සලකයි.

මේවා නිෂ්පාදන සාධකවලට අයත් වේ.

වසරකට වඩා වැඩි කාලයක් භාවිත කළ හැකි (දිගු කාලීනව) නිෂ්පාදන ක්‍රියාවලියට දායක වන භාණ්ඩ රටක දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය (දළ ආයෝජන වියදම) යි.

## දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය

දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය යනු, දේශීය ආර්ථිකයට එකතු වන දිගු කාලීන ප්‍රාග්ධන භාණ්ඩවල එකතුව යි.
එහි ප්‍රාග්ධන ක්ෂය වීම් ද ඇතුළත් වේ.

## ශුද්ධ දේශීය ප්‍රාග්ධන සම්පාදනය

ශුද්ධ දේශීය ප්‍රාග්ධන සම්පාදනය යනු දළ ප්‍රාග්ධන සම්පාදනයෙන් ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය අඩු කළ විට ලැබෙන අගය වේ.

ClassWork.LK

# දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයේ ප්‍රධාන කොටස්

- දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය
- තොග වෙනස් වීම
- වටිනාකම්හි වෙනස් වීම

රන්රිදී මුතු මැණික් ආදි වටිනා දේවල් අත්පත් කර ගැනීම් හා විකිණීම නිසා සිදු වන වෙනස වටිනාකමේ වෙනස් වීම වේ.

ClassWork.LK

# දළ දේශීය වියදම ගණනය කිරීම

ශ්‍රී ලංකාවේ දළ දේශීය වියදම ගණනය කරනුයේ ආර්ථිකයේ අවසාන පරිභෝජන වියදමට දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය ගැළපීමෙනි.

| |
|---|
| වෙළෙඳපොළ මිල අනුව දළ දේශීය වියදම = පෞද්ගලික පරිභෝජන වියදම + රාජ්‍ය පරිභෝජන වියදම + දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය |

ClassWork.LK

# <u>දළ දේශීය නිෂ්පාදිතය මත වියදම ගණනය කිරීම</u>

වෙළෙඳපොළ මිල අනුව දළ දේශීය වියදමට ශුද්ධ අපනයන ගැළපූ විට දළ දේශීය නිෂ්පාදිතය මත වියදම (දළ දේශීය නිෂ්පාදිතය) ගණනය කළ හැකි ය.

| |
|---|
| වෙළෙඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදනය මත වියදම = <br> දළ දේශීය වියදම + ශුද්ධ අපනයන |

| |
|---|
| වෙළෙඳපොළ මිල ගණන් අනුව දළ ජාතික ආදායම = <br> වෙළෙඳපොළ මිල ගණන් අනුව දළ දේශීය නිෂ්පාදිතය + <br> විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම් |

| |
|---|
| වෙළෙඳපොළ මිල ගණන් අනුව වැය කළ හැකි දළ ජාතික <br> ආදායම = වෙළෙඳපොළ මිල ගණන් අනුව දළ ජාතික <br> නිෂ්පාදිතය + විදේශීය ශුද්ධ වර්තන (ජංගම) සංක්‍රාම <br> (විදේශීය ශුද්ධ ද්විතීයක ආදායම්) |

ClassWork.LK

## <u>නිදසුන්,</u>

| | | |
|---|---|---|
| අවසාන පරිභෝජන වියදම (FCE)<br>කුටුම්බ පරිභෝජන වියදම<br>ලාභ අපේක්ෂාවෙන් තොර ව කුටුම්බ වෙත සපයන සේවා<br>රජයේ පරිභෝජන වියදම | 375<br>100<br>25 | 500 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය<br>ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය<br>තොග වෙනස් වීම්<br>වටිනාකම් හි වෙනස් වීම් | 400<br>250<br>150 | 800 |
| වෙළෙඳපොළ මිල අනුව දළ දේශීය වියදම (1+2) | | 1300 |
| ශුද්ධ අපනයන<br>අපනයන<br>ආනයන | 500<br>300 | 200 |
| වෙළෙඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදනය (3+4) ( GVO) | | 1500 |
| වෙළෙඳපොළ මිලට දළ ජාතික ආදායම (5+7) | | 1400 |
| විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම<br>විදේශීය ප්‍රාථමික ආදායම් ලැබීම්<br>විදේශීය ප්‍රාථිමික ආදායම් ගෙවීම් | 800<br>900 | -100 |
| වෙළෙඳපොළ මිලට වැය කළ හැකි දළ ජාතික ආදායම (6+9) | | 1650 |
| 9) විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම ( වර්තන සංක්‍රාම)<br>12.1 විදේශීය ජංගම සංක්‍රාම ලැබීම්<br>12.2 විදේශීය ජංගම සංක්‍රාම ගෙවීම් | 30<br>0<br>50 | 250 |

ClassWork.LK

# දේශීය ඉතුරුම්

යම්කිසි කාල පරිච්ඡේදයක ආරම්භයේ කුටුම්බ ඉතුරුම්, ව්‍යාපාරික ඉතුරුම් හා රාජ්‍ය ඉතුරුම්වල එකතුව දේශීය ඉතුරුම් වේ.

කිසියම් ආර්ථිකයක දළ දේශීය නිෂ්පාදනයෙන් මුළු පරිභෝජන වියදම් ඉවත් කළ පසු ද ඉතිරි කොටස දේශීය ඉතුරුම් ලෙස හඳුන්වයි.

දේශීය ඉතුරුම් ගණනය කිරීමේදී කුටුම්බ, ව්‍යාපාර හා රාජ්‍ය ඉතුරුම් ගණනය කිරීම අපහසු බැවින් ඒ සඳහා සාර්ව ආර්ථික සමතුලිතයේ දී දළ ආයෝජනය ඉතුරුම්වලට සමාන බැවින් (I = S) දළ ආයෝජනයට ශුද්ධ අපනයන ගැළපීමෙන් දේශීය ඉතුරුම් ලබා ගත හැකි ය.

$$I = GDCF + X - M$$

$$I = SD$$

GDCF = දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය / දළ ආයෝජනය

X-M = ශුද්ධ අපනයන

I = මුළු ආයෝජනය

ClassWork.LK

# <u>ජාතික ඉතුරුම්</u>

ජාතික ඉතුරුම් යනු යම් කාලපරිච්ඡේදයක දී දේශීය ඉතුරුම්වලට විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම් හා විදේශීය ශුද්ධ වර්තන සංක්‍රාම ගැළපූ විට ය.

# <u>මුළු සම්පත්</u>

යම් වර්ෂයක දී උපයෝජනය කිරීම සඳහා ආර්ථිකය සතු සම්පත් ප්‍රමාණය මුළු සම්පත් වශයෙන් හැඳින්වේ. එහි සංයුතිය පහත පරිදි වේ.
දළ දේශීය නිෂ්පාදනය භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයන ගැළපූ විට මුළු සම්පත් සම්භාරය ලැබේ.

| | |
|---|---|
| දළ දේශීය නිෂ්පාදිතය | 1500 |
| භාණ්ඩ හා සේවා සාධක නොවන ආනයන | 300 |
| සම්පත් සම්භාරය | <u>1800</u> |

ClassWork.LK

# සම්පත් උපයෝජනය

මුළු සම්පත් සම්භාරය භාවිත කරන ආකාරය සම්පත් උපයෝජනය වශයෙන් හැඳින්වේ.

# නිදසුන

| | |
|---|---|
| අවසාන පරිභෝජන වියදම් | 1000 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 300 |
| භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයන | 500 |

සම්පත් උපයෝජනය පහත පරිදි ගණනය කළ හැකිය.

| | |
|---|---|
| දළ දේශීය වියදම | 1300 |
| අපනයන | 500 |
| සම්පත් උපයෝජනය | 1800 |

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති
## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura